## රජයේ නිවේදන

### 2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ පනවනු ලබන නියමය

2005 අංක 6 දරන පනතින් සංශෝධිත පරිදි 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 2019 නොවැම්බර් 29 දිනැති අංක 2151/52 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත එකී 2අ වගන්තිය යටතේ වන නියමය, එම නිවේදනයේ 3වන ඡේදයට වහාම ඉක්බිතිව පහත නව ඡේදය ඇතුල් කිරීම මගින් සංශෝධනය කරමි.

"4. 1 (අ) ඡේදයේ කාර්යය සඳහා:

**(i)** "මුළු යෙදවුම් වටිනාකම" යන්නෙන් ශුන්‍ය අනුප්‍රමාණය අදාල වන බදු අයවන කාලසීමාවට වහාම පෙරාතුව වන බදු අයවන කාලසීමාව ආරම්භ වීමට පෙර අවසන් වන බදු අයවන කාලසීමාව තුළ මිලට ගත් භාණ්ඩ වල මුළු වටිනාකම අදහස් වේ.

**(ii)** "දේශීය සැපයුම්/ප්‍රභවයන් ගෙන් ප්‍රභවය වූ යෙදවුම්" යන්නෙන් ශුන්‍ය අනුප්‍රමාණය අදාල වන බදු අයවන කාලසීමාවට වහාම පෙරාතුව වන බදු අයවන කාලසීමාව ආරම්භ වීමට පෙර අවසන් වන බදු අයවන කාලසීමාව තුළ දේශීයව නිෂ්පාදනය කල කෘෂිකාර්මික, උද්‍යාන විද්‍යාත්මක, ධීවර, සත්ව පාලන හෝ කිරි නිෂ්පාදන සහ අවම වශයෙන් 10%ක දේශීය අගය එකතු කිරීමක් සහිත නිෂ්පාදන මිළදී ගැනීම සඳහා දරන ලද මුළු වියදම අදහස් වේ."

මහින්ද රාජපක්ෂ
මුදල් ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය

2019 දෙසැම්බර් මස 05 වැනි දින.
කොළඹ 01
මුදල් ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේදී ය

## Government Notifications

# Order under Section 2A of Value Added Tax Act, No. 14 of 2002 as amended by Act, No. 06 of 2005

BY virtue of the powers vested in me by Section 2A of the Value Added Tax Act, No. 14 of 2002, as amended by Act, No. 06 of 2005 I, Mahinda Rajapaksa, Minister of Finance, Economy and Policy Development do by this Order amend the Order made under said Section 2A and published in the *Extraordinary Gazette* Notification No. 2151/52 dated November 29, 2019 by the addition immediately after Paragraph 3 thereto, of the following new paragraph.

"4. For the purpose of Paragraph 1 (a):

**(i)** "Total value of inputs" means the total value of the goods purchased during the taxable period which ended prior to the commencement of the taxable period immediately preceding to the taxable period for which the zero percent (0%) Value Added Tax rate applies.

**(ii)** "Inputs which are sourced from local supplies/sources" means the total expenditure incurred for the purchase of locally produced agricultural, horticultural, fishing, animal husbandry or dairy products and any goods manufactured locally with minimum 10% local value addition, for the taxable period which ended prior to the commencement of the taxable period immediately preceding to the taxable period for which the zero percent (0%) Value Added Tax rate applies."

MAHINDA RAJAPAKSA,
Minister of Finance, Economy and Policy Development.

Ministry of Finance, Economy and Policy Development,
Colombo 01,
December 05, 2019.